# පුරප්පාඩු

ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ පහත සඳහන් තනතුර පුරප්පාඩු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

**දිස්ත්‍රික් සම්බන්ධීකරණ නිලධාරි තනතුර - JM 1-2 II ශ්‍රේණිය - තනතුරු-08**

**වැටුප් පරිමාණය** - (රු. 43,355/- 10 x 755/- 18 x 1,135/- 71,335/- )

- **සුදුසුකම් හා සේවා පළපුරුද්ද**

**බාහිර අයදුම්කරුවන් (පහත 1 හෝ 2 හෝ 3 )**

1.තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිසන් සභාව විසින් පිළිගත් කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයකින් ලබාගත් අදාල ක්ෂේත්‍රයේ ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) (සිවිල්) 07 මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් හෝ ඊට සමාන සුදුසුකම් ලබා තිබීම.

2.තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිසන් සභාව විසින් පිළිගත් කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් ලබාගත් අදාල ක්ෂේත්‍රයේ ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) (සිවිල්) 06 මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් හෝ ඊට සමාන සුදුසුකමක් ලබා තිබීම සහ සුදුසුකම ලැබීමෙන් පසු රජයේ දෙපාර්තමේන්තුවක / සංස්ථාවක /මණ්ඩලයක හෝ ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියට පිළිගත හැකි පුද්ගලික අංශයේ පිළිගත් ආයතනයක සමාන තනතුරක අවම වශයෙන් වසර 05 ක සේවා පළපුරුද්ද ලබා තිබීම සමග සිංහල හා ඉංග්‍රිසි භාෂා පිළිබඳ වැඩ කිරීමේ දැනුම සහ ලේඛන කටයුතු පිළිබඳ නිපුණතාව ලබා තිබීම.

3.තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිසන් සභාව විසින් පිළිගත් කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් ලබාගත් ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) (සිවිල්) 05 මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් / ජාතික තාක්ෂණික සහතිකය (සිවිල්) (NCT) හෝ සමාන සුදුසුකමක් ලබා තිබීම සහ සුදුසුකම් ලැබීමෙන් පසු රජයේ දෙපාර්තමේන්තුවක / සංස්ථාවක / මණ්ඩලයක / පිළිගත් ව්‍යවස්ථාපිත ආයතනයක හෝ ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියට පිළිගත හැකි පුද්ගලික අංශයේ පිළිගත් ආයතනයක වසර 10 ක සේවා පළපුරුද්ද ලබා තිබීම හෝ ඊට සමාන සුදුසුකම් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් : (පහත 1 හෝ 2)**

1. ඉහත බාහිර අයදුම්කරුවන් සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා තිබීම.
2. අදාළ ක්ෂේත්‍රයේ කළමනාකරණ සහකාර (තාක්ෂණික) - II ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් වසර 05 ක සතුටුදායක සේවා පළපුරුද්දක් තිබීම.

දිස්ත්‍රික් සම්බන්ධීකරණ නිලධාරීන් අදාළ දිස්ත්‍රික්කවල ස්ථානගත කරනු ලැබේ.

**වයස් සීමාව :-**

අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

අභ්‍යන්තර අයදුම්කරුවන්ට සහ දැනටමත් රාජ්‍ය සේවයේ නියුක්ත අයදුම්කරුවන්ට ඉහත සඳහන් උපරිම වයස් සීමාවන් බල පවත්වනු නොලැබේ.

## <u>වෙනත් ප්‍රතිලාභ</u>

- ❖ ඉහත වැටුපට අමතරව රජයේ අනුමත දීමනා ගෙවනු ලැබේ.
- ❖ සේවකයාගේ වැටුප් පදනම් කොටගෙන සේවක අර්ථසාධක අරමුදලට ආයතනයෙන් 15% ක දායකවීමක්ද , සේවකයාගෙන් 10%ක දායකවීමක්ද සමඟ ආයතනය විසින් සේවකයා වෙනුවෙන් 3% ක් සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට බැර කිරීමක් කරනු ලැබේ.
- ❖ වෛද්‍ය රක්ෂණ පහසුකම් සපයනු ලැබේ.
- ❖ රජයේ චක්‍රලේඛයන්ට අනුකූලව ප්‍රසාද දීමනා ගෙවනු ලැබේ.

අයදුම්කරුගේ ජීව දත්ත ඇතුලත්ව, නිසි පරිදි පිළියෙල කරන ලද අයදුම්පත , අධ්‍යාපන හා වෘත්තීය, පළපුරුද්ද පිළිබඳ සහතික කරන ලද සහතික පිටපත් සමඟ **ලියාපදිංචි තැපෑලෙන්** පහත සඳහන් ලිපිනය වෙත 2020.12.15 දින හෝ ඊට පෙර **ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ සභාපති වෙත** ලැබීමට සැලැස්විය යුතුය. රාජ්‍ය දෙපාර්තමේන්තු / සංස්ථා / ව්‍යවස්ථාපිත මණ්ඩල / ආයතනවල සේවය කරන අයදුම්කරුවන්ගේ අයදුම්පත්, තම දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානීන්ගේ නිර්දේශයන් සහිතව, ඔවුන් තෝරාගත හොත් දැනට දරන තනතුරින් නිදහස් කිරීමට හැකිද යන්න සඳහන් කර එවිය යුතුය. අයදුම්පත් එවීමේදී **<u>ලිපිකවරයේ වම්පස ඉහළ කෙලවරේ තමා අයදුම් කරන තනතුර</u>** පැහැදිලිව සඳහන් කර එවිය යුතුය.

***අසම්පූර්ණ හෝ ප්‍රමාද වී ලැබෙන අයදුම් පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. සුදුසුකම් සපුරා ඇති තෝරාගත් අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.***

**සභාපති**<br>**ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය**<br>**"සව්සිරිපාය"123 , විජේරාම මාවත,**<br>**කොළඹ 07.**